ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ලංකා ජෙමොලොජිකල් ලැබෝරටරි (ප්‍රයිවට්) ලිමිටඩ්හි 2019 අප්‍රේල් 01 දින සිට 2020 මාර්තු 31 දක්වා කාලය තුල කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කලයුතු මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සමාගම විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදිවන කාලසීමාවන් තුල එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තාද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කල යුතුය. එම පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික හා වෙනත් මූල්‍ය ප්‍රකාශන කාලානුරූපව පිළියෙල කිරීම සිදුවන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වලබලා ගනු ලැබිය යුතුය.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගනණ පනත සහ 2007 අංක 7 දරන සමාගම් පනතට පහත සඳහන් අවශ්‍යතා සඳහා නිශ්චිත ප්‍රතිපාදන ඇතුලත් වේ.

2007 අංක 7 දරන සමාගම් පනතේ 150 (1) වගන්තිය ප්‍රකාරව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශේෂ පත්‍රයේ දින සිට මාස 6 කින් පසුව වගකිව යුතු පුද්ගලයෙකු විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කර සහතික කරන බවට සහතික විය යුතුය.

### 2.1 මූල්‍ය ප්‍රකාශන

#### 2.1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015, 2016, 2017, 2018, 2019 හා 2020 වර්ෂ සඳහා වූ සමාගමේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | සමාගම විසින් පිළිතුරු ලබා දී නැත. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. |

### 2.1.2 මුල්‍ය ප්‍රකාශන සකස් කිරීම පිලිබඳ අභ්‍යන්තර පාලනය

සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා අභ්‍යන්තර ගිණුම්කරණ පාලන ක්‍රමයන් " සැලසුම් කිරීම සහ පවත්වාගෙන යාම " සඳහා ආයතන අවශ්‍ය කළමනාකරණයේ සාමාන්‍ය හෝ විපරිත ආවරණ අනුව ගනුදෙනු සිදු කිරීම අදාල වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීමට අවසරදීම සහ වත්කම් සඳහා වගවීම පවත්වා ගැනීම සඳහා ගනුදෙනු වාර්තා කර ඇති අතර වත්කම්වලට ප්‍රවේශ වීමට අවසර දී ඇතත් කළමනාකරණයේ සාමාන්‍ය හා විශේෂ අවසරය ඇතිව පමණක් වන අතර වත්කම් සඳහා අයකර ගත් පවතින වත්කම සමඟ සන්සන්දනය කරන්නේ සාධාරණ කාල පරාසයක් තුල වන අතර ඕනැම වෙනසක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. සාමාන්‍ය ලෙජරය, ජර්නල් සහ ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ප්‍රධාන ගිණුම් වාර්තා නඩත්තු කිරීම් සම්බන්ධව පවත්නා ගැටලු මෙම මාතෘකාව යටතේ ඇතුලත් විය හැකිය.

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **පොත් හා ගිණුම් පවත්වා ගෙනයාම** | | |
| සමාගම විසින් 2014 අප්‍රේල් 1 සිට 2020 මාර්තු 31 දක්වා කාලය තුල නඩත්තු කල යුතු පහත සඳහන් පොත් හා වාර්තා නඩත්තු කර නොතිබුණි.<br>(i) මුදල් පොත්<br>(ii) ලෙජර ගිණුම්<br>(iii) ජර්නල්<br>(iv) බැංකු සැසඳුම් ප්‍රකාශන<br>(v) ගෙවීම් වවුචර් | සමාගම විසින් පිලිතුරු ලබා දී නැත. | පොත් හා ගිණුම් පවත්වා ගැනීමට වහාම පියවර ගත යුතුය. |

## 2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 2.2.1 ගෙවිය යුතු ශේෂ

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් සභාපතිවරයාගේ හා අධ්‍යක්ෂකවරයෙකුගේ තායිලන්ත සංචාරය සඳහා රු.369,440 ක්ද ජර්මන් සංචාරය සඳහා රු.1,032,887 ක්ද ගෙවා තිබුණි.කෙසේ වුවත් එම මුදල 2020 මාර්තු 31 වන විටත් සමාගම විසින් පියවා නොතිබුණි. | සමාගම විසින් පිලිතුරු ලබා දී නැත. | හිඟ ශේෂය පියවීමට පියවර ගත යුතුය. |

## 2.3 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණන දිනය දක්වා ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට පියවර ගෙන නොතිබුණි. තවද **2020** මාර්තු **31** වන විටත් පිලිවෙලින් රු.**14,619,695** ක් හා රු.**4,784,831** ක්වූ ගෙවිය යුතු ආදායම් බද්ද හා රඳවා ගැනීමේ බදු ශේෂයන් නිරවුල් කර නොතිබුණි. | සමාගම විසින් පිලිතුරු ලබා දී නැත. | ආදායම් බදු සඳහා ලියාපදිංචි වී ඒ අනුව ආදායම් බදු ගෙවීමට පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම **2008** වර්ෂයේදී පිහිටුවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සමාගමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට සමාගමේ කළමනාකාරීත්වය අපොහොසත් වී තිබුණි. | සමාගම විසින් පිලිතුරු ලබා දී නැත. | සමාගමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කල යතුය. |